**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව-2012**

------------------------------------------------------------------------------------------

01. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

උපචිත පදනම මත ගිණුම් තබන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණු නමුත්, ඉදිරි වර්ෂය වෙනුවෙන් වැය කළ රු. 164,957ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.2.2 ගෙවිය යුතු ගිණුම්

-------------------

2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනයේ ඉල්ලුම් නොකළ බැරකම් ලෙස දැක්වෙන රු. 53,055ක් නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉන්ධන | 83,330 | ඉන්ධන බිල්පත් 21ක ඉන්ධන යෙදූ වාහනවල අංක |
| ලියාපදිංචි ගාස්තු | 16,800 | ගෙවීම් තහවුරු කිරීම් |

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 14 (I) වගන්තිය | අමාත්‍යවරයාට ලබා දිය යුතු උපදෙස් හා නිර්දේශ කිරීම්, මානව සම්පත් සංවර්ධන සැලැසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම් යනාදී වශයෙන් වූ සභාවේ කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාවට නැංවී නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, 2012 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය |

| | | |
|---|---|---|
| | | ඇස්තමේන්තුව පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2012 මාර්තු 29 දින දී ය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 371 | අනුමත සීමාව වූ රු. 20,000ක් ඉක්මවා නිලධාරීන් තිදෙනෙකු වෙත එකතුව රු. 500,000 ක් අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.6 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවැයගත ශේෂ පත්‍රයක් පිළියෙල කර අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය | ඉදිකිරීම් කටයුතු, වාහන, පරිගණක කුලියට ගැනීම් සහ ටී ෂර්ට් හා කැමරා මිල දී ගැනීම් සඳහා එකතුව රු.577,350 ක් වැය කර තිබුණත්, ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂය තුළ සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 3,756,366ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 758,795ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,997,571 ක පිරිහීම සඳහා මුළු වියදම රු. 7,052,773කින් අඩු වී තිබුණ ද, රජයේ ප්‍රදාන රු. 10,047,417කින් අඩු වීම විශේෂයෙන් බල පා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සභාවේ මූලික අරමුණ වූ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් වැය කළ මුදල මුළු පුනරාවර්තන වියදමට ප්‍රතිශතයක් ලෙස ගත් විට අඩු අගයක් ගෙන තිබුණි.

| වර්ෂය | මුළු පුනරාවර්තන වියදම | මානව සම්පත් සංවර්ධනය වැය | මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධනය වැය |
|---|---|---|---|
| | රු. | රු. | (සියයට) |
| 2008 | 6,728,939 | 659,801 | 09.80 |
| 2009 | 8,675,394 | 1,540,029 | 17.70 |
| 2010 | 12,423,287 | 3,378,959 | 27.20 |
| 2011 | 30,247,869 | 19,182,148 | 63.42 |
| 2012 | 23,195,095 | 10,003,639 | 43.13 |

(ආ) ශ්‍රී ලංකාවේ රැකියා විරහිත වෘත්තිකයන්ගේ දත්ත පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාමට 2011 සැප්තැම්බර් මස සභාව, පුද්ගලික සමාගමක් සමග අවබෝධතා ගිවිසුමකට එළැඹ තිබුණු අතර වෙබ් අඩවි තුනක් නිර්මාණය කර පවත්වාගෙන යාම ද එම ව්‍යාපෘතියේ අරමුණක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කර තිබුණු පිරිවැය ඇස්තමේන්තුව අනුව, වෙබ් අඩවියක් නිර්මාණය සඳහා අවශ්‍ය ඩෙඩිකේටඩ් සර්වර් (Dedicated Server) සඳහා රු. 40,000ක් වැය කර තිබුණත්, එම කාරණයටම නැවතත් රු. 132,500ක් ගෙවා තිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත්තුව භාර දීමට පෙර අදාල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් කර නොතිබුණු අතර එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.

(iii) දත්ත පද්ධතිය හා වෙබ් අඩවි නිර්මාණය කර තිබුණ ද, සභාව විසින් 2013 අගෝස්තු 14 දින දක්වා ඒවා භාවිතයට ගෙන නොතිබුණු බැවින් ඒ වෙනුවෙන් වැය කළ රු. 942,975ක මුදල නිශ්ඵල වී තිබුණි.

(ඇ) ෆ්ලයි නෙට් (Fly Net) වැඩසටහන

විකල්ප වෘත්තීය මාර්ගවලට යොමු වීම තුළින් ජීවිතය ජය ගත හැකි බව පෙන්වා දීම හා ඒ සඳහා ඔවුන් අදාල පුහුණු ආයතනවලට යොමු කිරීම මූලික අරමුණ කර ගෙන අ.පො.ස. (සා.පෙළ) හා (උ.පෙළ) අසමත් සිසුන් සවි බල ගැන්වීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේ දී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විභාග දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂය වෙනුවෙන් ලබා දී ඇති දත්තවලට අනුව, උසස් පෙළ හා සාමාන්‍ය පෙළ අසමත්වීම නිසා මෙම වැඩසටහන සඳහා සහභාගි කර ගත යුතු මුළු සිසුන් සංඛ්‍යාව 270,048 කි. සැලැසුම් කළ පරිදි නේවාසික කඳවුරු කිසිවක් පවත්වා නොතිබුණු අතර මෙම වැඩසටහන යටතේ සිදු කළ එකම කාර්ය වූයේ දිස්ත්‍රික් සම්මන්ත්‍රණ 05ක් පැවැත්වීම පමණක් වූ අතර ඒ සඳහා සිසුන් 640 ක් වැනි ඉතා සුළු පිරිසක් සහභාගී වී තිබුණි.

(ii) එෆ්-03, ඩබ්ලිව්-09 හා ෆ්ලයි නෙට් වශයෙන් වූ විවිධ නම්වලින් ක්‍රියාත්මක කළ ඉහත විභාග අසමත් සිසුන් සඳහා වූ වැඩසටහන වෙනුවෙන් 2010 සිට 2012 වර්ෂය දක්වා රු. 21,055,033ක් වැය කළ ද මේ සඳහා සහභාගි කර ගැනීමට හැකි වී තිබුණේ සිසුන් 465,057ක් හෙවත් අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවෙන් සියයට 2.49ක් පමණි. එම සිසුන් 11,578 දෙනාගේ ප්‍රගතිය පිළිබඳව ද කිසිදු දත්තයක් සභාව සතු නොවූ අතර මෙම වැඩසටහනේ සමස්ත වියදමින් සියයට 61ක් ප්‍රචාරනය සඳහා විය.

(ඈ) සෙසු ව්‍යාපෘති

---------------

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික අංශයේ රැකියා අපේක්ෂකයන් ලියාපදිංචි කර ඔවුන් 2012 මාර්තු 31 දිනට පෙර රැකියා ගත කිරීමේ "විරැකියාවෙන් සුරැකියාවට" ව්‍යාපෘතිය 2012 මාර්තු 31 දින අවසන් වී තිබුණු අතර මේ සඳහා වැය කළ මුදල රු. 2,218,153කි. බාහිර උපදේශකවරයෙකු විසින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටු නොවුණු එය මුළුමනින්ම අසාර්ථක ව්‍යාපෘතියක් වී තිබුණි. එසේ තිබියදීත් 2012 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලයකට සෙසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යැයි දක්වමින් සභාපතිවරයා විසින් එම උපදේශකවරයාම පත් කර ඒ සඳහා රු. 280,000ක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පාලක මණ්ඩල ආවරණ අනුමැතියක් හෝ නොතිබුණි.

(ii) සෙසු ව්‍යාපෘති යනුවෙන් දක්වා තිබුණ ද, එමගින් ඉටු කරන කාර්යයන් මෙන්ම යටත් පිරිසෙයින් ඒවා කුමන ස්වරූපයේ ව්‍යාපෘති ද යන්න පවා පැහැදිලි කර නොතිබුණි.

(iii) ඇස්තමේන්තුගත වටිනාකම රු.700,000ක්වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු ඉටුකිරීම සඳහා ගිවිසුමකට එළැඹ නොතිබුණි. ප්‍රගතිය පිළිබඳ විස්තර කිසිවක් ද නොවූයෙන් උපදේශකවරයා වෙත යම් කාර්යභාරයක් පැවරුවේ ද යන්න පවා අවිනිශ්චිත විය.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි මෙය තරඟකාරී ලංසු කැඳවීමකට යොමු කර නොතිබුණි.

(v) මෙම ව්‍යාපෘතිය මගින් මුදුන් පමුණුවා ගත් කිසිදු අරමුණක් නොවූ බැවින් ඒ වෙනුවෙන් වැය කළ රු. 280,000ක මුදල නිශ්ඵල වී තිබුණි.

(vi) ඉහත උපදේශකවරයාට රු. 60,000ක් මුදලින් ගෙවූ ලෙස වවුචරයක සටහන් කර තිබුණු නමුත් ඔහු විසින් එම මුදල් භාර ගත්තේ ද යන්න විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

(ඉ) දැයට කිරුළ ව්‍යාපෘතිය - 2012

2012 පෙබරවාරි 03 සිට 12 දින දක්වා අනුරාධපුර ඔයා මඩුවේ දී පැවැති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් රු. 2,529,431ක් වැය කර තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය 06ක් හා උපදේශකවරයා ඇතුළු කාර්ය මණ්ඩලය 07ක් ලෙස 13 දෙනෙකු පමණක් මෙම ප්‍රදර්ශනයට සහභාගී වී තිබුණු අතර ඔවුන් සඳහා 2012 පෙබරවාරි 02 සිට 12 දින දක්වා ආහාර වෙනුවෙන් රු. 61,180ක් පර්යේෂණ සහකාර නිලධාරීන් විසින් වැය කර තිබුණි. නමුත් හිටපු සභාපතිවරයා විසින් නැවතත් දින 08ක් සඳහා නිලධාරීන් 25 දෙනෙකුට ආහාර සැපයීම් කළ බවට දක්වමින් රු. 88,390 ක මුදලක් ලබා ගෙන තිබීම මතභේදයට තුඩු දෙන ගනුදෙනුවක් විය.

(ii) හිටපු සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ බිල්පත් අනුව, පුද්ගලික ආයතනයක් වෙත රු. 60,050 ක් ගෙවා තිබුණු නමුත් ඉන් සභාවට ලද ප්‍රතිලාභයක් නොවීය.

(iii) නවාතැන් සඳහා නිවාස 02ක් හා හෝටලයක් වෙන් කර ගෙන ඒ සඳහා රු. 367,178ක් වැය කළ නමුත්, ව්‍යාපෘති උපදේශක ඇතුළු කාර්ය මණ්ඩලය පූර්ණකාලීනව දින 15 එහි රැඳී සිටි බවට සාක්ෂි නොවීය. එමෙන්ම, එම නිවාසවල පැවැති පහසුකම්, නවාතැන් ගත හැකි සංඛ්‍යාව යනාදී තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඊ) සභාව විසින් 2012 ජූලි සිට සැප්තැම්බර් දක්වා කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණු බැවින් එම කාලය තුළ වැටුප් හා අනෙකුත් පොදුකාර්ය සඳහා වැය කළ රු. 1,216,361ක් නිෂ්ඵල වියදම් බවට පත් වී තිබුණි.

(උ) 2012 දෙසැම්බර් 31 වන දිනට පිළියෙල කළ ප්‍රගති වාර්තාව පරිදි මුළු ප්‍රතිපාදන ඉතිරිය රු. මිලියන 30.49ක් වූ අතර, ඒ තුළ රු. මිලියන 12.90ක ප්‍රතිපාදන සහිත ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම, ව්‍යාපෘති 02ක ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 0.98ක් වැය කර තිබුණි.

(ඍ) 2010, 2011 හා 2012 වර්ෂ තුළ රු. 27,501,957 ක් වැය කර සභාව විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 13 ක් අතරමග අතහැර දමා තිබුණි. එම තෙවර්ෂයෙහි රු. 32,564,746ක් වූ මුළු මානව සම්පත් සංවර්ධන වැයට ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 84ක් විය.

(එ) 2012 වර්ෂය තුළ ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස රජයෙන් රු. 10,301,090ක ප්‍රදාන ලැබී තිබුණු අතර එම වර්ෂය තුළ සභාව විසින් ඉපයූ ආදායම රු. 85,090ක ඉතා අඩු අගයක් විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

2012 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 05ක් පමණක් පවත්වා තිබුණු අතර ඒ කිසිදු රැස්වීමකට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු සහභාගි වී නොතිබුණු අතර තවත් සාමාජිකයන් හත් දෙනෙකුගේ සහභාගීත්වය දුර්වල තත්ත්වයක පැවැතිණි.

3.3 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර දිස්ත්‍රික් ව්‍යාපෘතියක් සහ අම්පාර හා කෑගල්ල දිස්ත්‍රික් සමාලෝචන රැස්වීම් සඳහා පිළිවෙලින් රු.47,100ක් හා රු. 21,000ක් ලෙස එකතුව රු. 68,100ක් හිටපු සභාපතිවරයා විසින් ලබා ගෙන තිබුණු නමුත් එවැනි ව්‍යාපෘතියක් හා රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි.

(ආ) "ශ්‍රී ලංකා දේශපාලනයේ මහින්දවාදී න්‍යාය" යනුවෙන් ග්‍රන්ථයක් පිළියෙල කරන බවට පුවත්පත් දැන්වීමක් පල කර ඊට රු. 43,097 ක් ද, වෙනත් වියදම් රු. 26,314ක් ද ලෙස එකතුව රු. 69,411 ක් වැය කර තිබුණු නමුත් එවැනි පොතක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2011 සැප්තැම්බර් සිට 2012 සැප්තැම්බර් දක්වා මානව සම්පත් සංවර්ධන වසර ලෙස සභාව විසින් හඳුනා ගෙන ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සමස්ත නිපුණතා ප්‍රජාවටම සහභාගි විය හැකි ගායන තරඟාවලියක් මගින් දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් "නිපුණතා සඳ"තේරීමේ රියැලිටි වැඩසටහනක් පැවැත්වීමට සැලැසුම් කර ඒ සඳහා ප්‍රචාරනය වෙනුවෙන් රු. 3,107,497ක් ද, අනෙකුත් වියදම් සඳහා රු. 26,889ක් ද ලෙස එකතුව රු. 3,124,386ක් වැය කර තිබුණු අතර මාධ්‍ය දැන්වීම් පල කිරීම හැර වෙනත්

කිසිදු කටයුත්තක් ඉටු නොකර 2012 ජූනි මාසයෙන් පසු මෙම ව්‍යාපෘතිය අත් හැර දමා තිබුණි.

3.4 මතභේදයට තුඩු දුන් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැසුමේ වූ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති කිහිපයක් සඳහා යැයි දක්වමින් අන්තර් ජාල පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් රු. 22,400ක් ගෙවා තිබුණු නමුත් එමගින් ඉටු වූ අරමුණු කිසිවක් නොවීය.

(ආ) විද්‍යුත් හා පුවත්පත් මාධ්‍ය දැන්වීම් සඳහා ඍජුව එම ආයතන වෙත අදාල කාර්යයන් භාර දීම වෙනුවට පෞද්ගලික සමාගමක් වෙත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර 2012 වර්ෂය තුළ දී පමණක් රු. 4,937,720ක් ගෙවා තිබුණි. මෙම ආයතනය සභාවේ හිටපු සභාපතිවරයාගේ ස්ථිර පදිංචි ලිපිනයේම පවත්වාගෙන යන ව්‍යාපාරයක් බව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත නිකුත් කළ පත්වීම් ලිපියේ සඳහන් ලිපිනය සහ එම සමාගමේ ලිපිශීර්ෂවල සඳහන් ලිපිනය අනුව තහවුරු විය.

(ඇ) 2012 මැයි මස රත්නපුර පැවැත් වූ එක් දින දිස්ත්‍රික් සම්මන්ත්‍රණයක් වෙනුවෙන් හිටපු සභාපතිවරයා විසින් ලබා ගත් රු. 19,600 ක ඉන්ධන වියදම් සඳහා ඉදිරිපත් කළ බිල්පත් සියල්ල ඊට මාසයකට පමණ පසු ලබා ගත් ඉන්ධන වෙනුවෙන් වූ බිල්පත් විය.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 සංයුක්ත සැලැසුම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උප ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් පිළිබඳ සමාලෝචනයක් වර්ෂයේ 2010 සිට 2014 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගැයීමට නොහැකි විය.

4.2 ක්‍රියාකාරී සැලැසුම

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැසුම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණේ 2012 මාර්තු 29 දින දී ය.

4.3 ප්‍රසම්පාදන සැලැසුම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ දී මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැසුමක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

සභාව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය වූ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සභාවේ කටයුතු විගණනයට භාජනය කර තිබුණි.

4.5 අයවැය පාලනය

ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් විෂයයන් 03ක සියයට 75ක විචලනයක් පෙන්නුම් කෙරුණි. මේ අනුව අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තුව ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය

(ආ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය